 ISSN 2362-0412

# කුස ජාතකයෙහි අන්තර්ගත පබාවතී චරිතයෙහි කාලානුවර්තී ප්‍රතිනිර්මාණය පිළිබඳ අධ්‍යයනයක්

එල්. එච්. ජිනෙස්කා ලක්මිණී
*සිංහල අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*


## සංක්ෂේපය

බෝසත් චරිතය අළලා කුරුණෑගල රාජධානි කාලයෙහි රචනා කළ *පන්සිය පනස් ජාතක* පොත සඳහා *පාලි ජාතකට්ඨ කථාව* මූලාශ්‍රය විය. කුස ජාතකය ජාතක පොතෙහි ඇතුළත් ප්‍රමුඛ ප්‍රේම වෘත්තාන්තයකි. එය පසුකාලීන ව විවිධ සාහිත්‍ය හා කලා නිර්මාණ බවට ප්‍රතිනිර්මාණය විය. ඇතැම් ජාතක කථා සමග සසඳන විට කුස ජාතකයෙහි ඇත්තේ අංග සම්පූර්ණ කථා වස්තුවකි. ඒ හේතුවෙන් එය සිංහල සාහිත්‍යයෙහි විවිධ අවධිවල නොයෙක් කතුවරයන්ගේ සැලකිල්ලට බඳුන් විය. කුස ජාතකය ප්‍රතිනිර්මාණය කළ මුල් ම කතුවරයා *කව්සිළුමිණ* ලියූ පණ්ඩිත පරාක්‍රමබාහු රජු ය. අනතුරුව අලගියවන්න මුකවෙටි *කුස ජාතක කාව්‍ය* සඳහා ද, ගම්බද නාඩගම්කරුවන් නාඩගම් සඳහා ද, ජෝන් ද සිල්වා සංගීත නාට්‍යයක් සඳහා ද, එදිරිවීර සරච්චන්ද්‍රයන් *පබාවතී* නාට්‍ය සඳහා ද, ඉතාමත් මෑත අවධියේ සුනිල් ආරියරත්නයන් කුස පබා චිත්‍රපටිය සඳහා ද කුස ජාතකය පදනම් කොට ගෙන ඇත. මෙහි ප්‍රධාන චරිත දෙකකි. එනම් කුස හා පබාවතිය යි. කුස ජාතකය පදනම් කොට ගෙන බිහි වූ සාහිත්‍ය හා කලා නිර්මාණවල පබාවතියගේ චරිතය විවිධ කලාකරුවන් කාලයත් සමග වෙනස් ආකාරයට ප්‍රතිනිර්මාණය කළ බැව් පෙනේ. මෙම අධ්‍යයනයේදී ප්‍රාථමික හා ද්විතීයික දත්ත මූලාශ්‍රය ලෙස ග්‍රන්ථ පුවත්පත්, වාර ප්‍රකාශන සහ චිත්‍රපට මාධ්‍ය භාවිත කළ අතර දත්ත ඉදිරිපත් කිරීමේ දී හා විශ්ලේෂණය කිරීමේ දී ලේඛනය හා ඡායාරූප භාවිතයට ගනු ලැබී ය. ජාතක කථාවෙහි පබාවතියගේ චරිතය තත්කාලීන සමාජයට උචිත ලෙසින් සියලු බන්ධනයන්ට යටත් ව ද, *කව්සිළුමිණෙහි* එය මහා කාව්‍යයක අන්තර්ගත කථා නායකයාගේ චරිතයට අනුකූල ව ක්ෂත්‍රිය රාජ පරිසරයකට ගැළපෙන ආකාරයට ද, *කුස පබා* චිත්‍රපටිය වාණිජ සිනමාවට උචිත සමාජ පරිසරයක ද ප්‍රතිනිර්මාණය කොට ඇත. පබාවතී චරිතය කාලානුවර්තී ව ගැහැනියකට වාසි නොවන පීඩිත තත්ත්වයෙන් ප්‍රතිනිර්මාණය කළ අතර පබාවතී කෙරෙහි පුරුෂාධිපත්‍යයෙහි බලපෑම තීව්‍ර වන ආකාරයටද නිමවා තිබේ . මෙම පර්යේෂණයේ අරමුණ පබාවතී චරිතය කාලානුවර්තී ව ප්‍රතිනිර්මාණය වූ ආකාරය මූලාශ්‍රය වූ ජාතක කථාව හා *කව්සිළුමිණ* හා *කුස පබා* චිත්‍රපටිය ඇසුරෙන් අධ්‍යයනය කිරීම යි.


*ප්‍රමුඛපද : කාලානුවර්තී ප්‍රතිනිර්මාණය, පබාවතී චරිතය, කුස ජාතකය, කව්සිළුමිණ , කුස පබා චිත්‍රපටිය*